සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

| 57 | S | I |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Second Term Test - Grade 13 - 2018

විභාග අංකය .............................

# නාට්‍ය හා රංගකලාව I

කාලය පැය තුනයි

උපදෙස්

- I කොටස II කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

01. ප්‍රාසාංගික කලා යන්නෙන්,
    1. සියලුම ලලිතකලා අදහස් කෙරේ.
    2. රංගනයෙන්, ගායනයෙන් හා කතනයෙන් ඉදිරිපත් කෙරේ.
    3. ශ්‍රව්‍ය, දෘශ්‍ය කලා සියල්ල ගම්‍ය වේ.
    4. ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ සජීවී ව ඉදිරිපත් කරනු ලබයි.
    5. විවිධ ප්‍රසංග මගින් ඉදිරිපත් කරන කලාංග යන අදහස ගම්‍ය වේ. (.........)

02. නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය
    1. පෙරදිග බිහි වූ සංකල්පයකි.
    2. අංගත්‍රයම සතර අභිනය මගින් ඉදිරිපත් කෙරේ.
    3. අංගත්‍රයම මුද්‍රා නාටය කෙරෙහි යොදා ගැනේ.
    4. බටහිරින් පෙරදිගට සංක්‍රමණය වූ සංකල්පයකි.
    5. වචන තුනම 'නෘත්' ධාතුවෙන් නිෂ්පන්න වී ඇත. (.........)

03. බැලේ යනු,
    1. විශේෂයෙන් හස්ත හා පාද චලන යොදා ගනිමින් ඉදිරිපත් කරයි.
    2. මුද්‍රා නාට්‍ය යනු 'බැලේ යන්නට' සමානාර්තවාචී නාම පදයකි.
    3. ශිල්පීන් සම්පූර්ණ ශරීරයම භාව ප්‍රකාශනය සඳහා යොදා ගන්නා නර්තන ප්‍රභේදයකි.
    4. ගායනයට හා වාදනයට ප්‍රධාන තැනක් දෙන කලා නිර්මාණයකි.
    5. විවිධ රංගන හා ගායන ශෛලීන් යොදා ගන්නා කලා මාධ්‍යයකි. (.........)

04. සිනමාවට අදාල නොවන වරණය තෝරන්න.

1. ශ්‍රව්‍ය - දෘශ්‍ය කලා මාධ්‍යයකි.
2. රූප රාමු දූරස්ථ, මධ්‍යස්ථ, සමීපස්ථ ලෙස යොදා ගනී.
3. නළු නිළියන් කථාවේ එන සියලු දෙබස් මතකයෙන් කිව යුතු නොවේ.
4. ප්‍රේක්ෂක ප්‍රතිචාර චිත්‍රපට දර්ශනය කෙරෙහි බෙහෙවින් බලපායි.
5. කලින් නිර්මාණය කොට ගබඩා කර තැබිය හැකි කලා මාධ්‍යයකි. (.........)

05. ගීත නාටක යනු,

1. බටහිර බැලේ ආභාෂය සහිත නාට්‍ය වර්ගයකි.
2. රංග භූමි අලංකරණයට ප්‍රමුඛත්වය හිමිවන නාට්‍යයයි.
3. ගායනයට ප්‍රමුඛත්වයක් හිමිවන නාට්‍ය විශේෂයකි.
4. මුද්‍රා නාට්‍යයට බෙහෙවින් සමාන වන නාට්‍ය විශේෂයකි.
5. අභිනය භාවිතා නොවන කලාවකි. (.........)

06. පහත දැක්වෙන කෘති අතුරින් පැරණිම කෘතිය වන්නේ,

1. භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රය
2. ධනංජයගේ දශ රූපය
3. ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රය
4. නන්දිකේශ්වරගේ අභිනය දර්පණය
5. රාමචන්ද්‍ර හා ගුණචන්ද්‍රගේ නාට්‍ය දර්පණය (.........)

07. ඇරිස්ටෝටල් නාට්‍යයේ වැදගත් ම අංගය ලෙස සැලකුවේ,

1. චින්තනය 2. වස්තුව 3. වාග් විලාසය 4. චරිතය 5. ප්‍රේක්ෂාව (.........)

08. සංස්කෘත නාට්‍යයක නේතෘ වර්ගීකරණය කොට ඇති ගොනුව තෝරන්න.

1. ආධිකාරික, ධීරලලිත, ප්‍රාක්‍යාත, ධීර ශාන්ත
2. ධීර ලලිත, ධීර ශාන්ත, ධීරෝදාත, ධීරෝදාන්ත
3. ස්වකීය. ධීර ශාන්ත, ධීරකංචුක, ධීරෝදික
4. සාධාරනා, ඌර්ණරෝම, ධීර ලලිත, ධීරෝදාන්ත
5. ධීරෝදාන්ත, ශකාර, පීඨමර්ද, ධීරශාන්ත (.........)

09. දස රූපක ප්‍රභේදයට අයත් අංග ඇතුළත් වරණය තෝරන්න.

1. ඩිම. සමවකාර, අවස්ථා, අංග
2. ප්‍රහසන, භාණ, චූලිකා, මිශ්‍ර
3. නාටක, නාටිකා, විශ්කම්භක, අංකාවතාර
4. නාටක, ප්‍රකරණ, ඩිම, සමවාකාර
5. ප්‍රඛ්‍යාත, ප්‍රකරි, නාටිකා, ව්‍යායෝග (.........)

10. සාත්වික භාව 04 ක් නිවැරදිව අන්තර්ගත වරණය තෝරන්න.

1. වෛවර්ණ්‍ය, ප්‍රලය, ස්ථම්භ, අශ්‍රු
2. අග්නි, ස්ථම්භ, ප්‍රලය, ස්මරණ
3. වේපථු, ස්වරභංග, සංකා, ආනුභාව
4. රෝමාංච, විභාව, උද්දීපන, වෛවර්ණ්‍ය
5. ස්ථායිභාව, ග්ලානි, ස්මෘති, නිද්‍රා (.........)

11. ට්‍රැජඩි හෙවත් ශෝකාත්ම නාට්‍යයක මූලිකාංග හය ඇරිස්ටෝටල් පෙළ ගස්වා ඇති අනුපිළිවෙල වන්නේ,
1. වස්තුව, චින්තනය, සංගීතය, ප්‍රේක්ෂාව, වාග් විලාසය, චරිත
2. චරිත, වස්තුව, චින්තනය, ප්‍රේක්ෂාව, සංගීතය, වාග් විලාසය
3. කතා වින්‍යාසය, චරිත, චින්තනය, වාග් විලාසය, ප්‍රේක්ෂාව, සංගීතය
4. කතා වින්‍යාසය, චරිත, සංගීතය, වාග් විලාසය, ප්‍රේක්ෂාව, චින්තනය
5. වස්තුව, වාග් විලාසය, චරිත, චින්තනය, ප්‍රේක්ෂාව, සංගීතය (.........)

12. ප්‍රොසිනියම් රංග භූමියේ වේදිකාව පිටුපස ඇති තිරය හඳුන්වන නම් වේ.
1. ප්‍රධාන තිරය, අහස්තිරය, තිරස්කරණී
2. සයික්ලෝරාමාව, ගගනිකාව, අහස්තිරය
3. ගගනිකාව, ප්‍රධාන තිරය, යවනිකාව
4. ජවනිකාව, සයික්ලෝරාමාව, ප්‍රධානතිරය
5. ගගනිකාව, යමනිකාව, කඩතුරාව (.........)

13. පෙරදිග නාට්‍ය සම්ප්‍රදායට අයත් වන්නේ,
1. ග්‍රීක නාට්‍ය, රෝම නාට්‍ය, ජපන් නාට්‍ය
2. එලිසබතන් නාට්‍ය, ජපන් නාට්‍ය, මධ්‍යකාලීන නාට්‍ය
3. ජපන් නාට්‍ය, චීන නාට්‍ය, සංස්කෘත නාට්‍ය
4. සංස්කෘත නාට්‍ය, මධ්‍යකාලීන නාට්‍ය, යුරෝපීය නාට්‍ය
5. මධ්‍යකාලීන නාට්‍ය, චීන නාට්‍ය, එංගලන්ත නාට්‍ය (.........)

- **පහත සඳහන් ගීත ඛණ්ඩ උපයෝගී කරගෙන අංක 14 සිට 18 දක්වා වන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A- වාසනා දිනේකි මේක පාමු තුටින්
B- ඇසට නැතේ
C- උත්තමවන් ලොව පතලා
D- ආලවෙලා පියසේ පටන්
E- දූලා නෙතු පුලා
F- ගම්බිර තෙදැති කොන්ස් තන්තීනු පුරේ
G- හදපානේ පිපි වැටකේ මල සේ
H- බෝ දොස් කියා මාගේ
I- අත්තක පිපි මලක් ලෙසේ
J- ගව සම්පත් බෝ වේවා

14. නාඩගම් සම්ප්‍රදායට අයත් ගීත වන්නේ,
1. A C ය. 2. C G ය. 3. D J ය.
4. C F ය. 5. G I ය. (.........)

15. නූර්ති සම්ප්‍රදායට අයත් ගීත වන්නේ,
1. A D ය. 2. A H ය. 3. B E ය.
4. D I ය. 5. G H ය. (.........)

16. උඩරට සහ පහතරට ගැමි නාටකයන්ට අයත් වේ.
1. C I ය. 2. J D ය. 3. F H ය.
4. E F ය. 5. E J ය. (.........)

17. එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ නාට්‍ය දෙකකට අයත් ගීත වන්නේ,

1. B D ය. 2. C E ය. 3. B E ය.

4. E J ය. 5. H I ය. (.........)

18. පාස්කු හා ශාන්තිකර්ම වලට අයත් වරණය වන්නේ,

1. A E ය. 2. B I ය. 3. C I ය.

4. D J ය. 5. G I ය. (.........)

19. වේදිකාව මත සුදු ආලෝකයට පමණක් ප්‍රතික්‍රියා දක්වන ආලෝක පහන් වර්ගය වන්නේ,

1. ධාරාලෝක පහන 2. යොමු පහන 3. වර්ණ චක්‍රය

4. හැලජන් පහන 5. අල්ට්‍රා වයලට් පහන (.........)

20. වර්ණ චක්‍රයක (colour wheel) ආලෝක කව තුළ ඇති මූලික වර්ණයන් වන්නේ,

1. නිල්, කහ, කොළ, රතු, සුදු 2. කහ, තැඹිලි, ඇම්බර්, කොළ, දම් 3. රතු, නිල්, දම්, රෝස, තැඹිලි

4. සුදු, කහ, දම්, කොළ, රතු 5. කොළ, කහ, දුඹුරු, තැඹිලි, නිල් (.........)

21. ආනුෂංගික අංග වලට අයත් වන්නේ,

1. අංගරචනය, රංගභූමි පාලනය, රංග භූමි තාක්ෂණය, රංගාලෝකය
2. පසුතල නිර්මාණ, නාට්‍ය පිටපත, අධ්‍යක්ෂණය, සංගීතය
3. අංග රචනය, රංගාලෝකය, රංග රචනය, පසුතල නිර්මාණ
4. රූපණය. රංගාලෝකය, රංග වින්‍යාසය, ප්‍රේක්ෂාව
5. ප්‍රේක්ෂකයා, රංගෝපක්‍රම, නාට්‍යෝපකරණ, සංගීතය (.........)

22. ස්ටැනිස්ලාව්ස්කි විසින් නව රූපණ විධි ක්‍රමය පිළිබඳව ලියා ඇති කෘතිය වන්නේ,

1. රූපණ න්‍යාය 2. නළු කාර්යය 3. නළුවා වෙතටයි

4. නළුවකුගේ පෙරහුරුව 5. කලාකරුවාගේ ජීවිතය (.........)

- **පහත දැක්වෙන පද ආශ්‍රයෙන් අංක 23 - 27 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - නියතඵල ප්‍රාප්ති B - සතතාභ්‍යාසය

C - හුදු අංග චලන භාවිතය D - අවම පසුතල භාවිතය

E - භාව ප්‍රකාශනයෙන් තොරවීම. F - වේදිකාවේ නොපෙනී සිට කරන ප්‍රකාශන

G - සංගීතය බහුල වීම. H - ප්‍රාප්තිසම්භවය

I - කක්ෂ්‍යා විභාගය J - ස්මරණ ශක්තිය

23. රූපණය හා සම්බන්ධ වන්නේ,

1. A C 2. B E 3. D G 4. H J 5. B J (.........)

24. නාට්‍යධර්මී ශෛලිය හා සම්බන්ධ වන්නේ,

1. A C 2. D G 3. A B 4. H J 5. E F (.........)

25. සංස්කෘත කතා වස්තුවේ අවස්ථා පහට අයත් අවස්ථාවන් වන්නේ,

1. A H 2. B I 3. A B 4. H J 5. E F (.........)

26. සංස්කෘත නාට්‍ය සම්ප්‍රදායේ රංගනය හා සම්බන්ධ වන්නේ,

1. A C 2. C I 3. E G 4. I F 5. H J (.........)

27. නෘත හා සම්බන්ධ වන්නේ,

1. B H 2. C I 3. C E 4. D J 5. E H (.........)

28. නාට්‍යය පිළිබඳ 'බර්නාඩ් ෂෝ' විසින් කර ඇති ප්‍රකාශය වන්නේ,

1. නාට්‍යය යනු ක්‍රියාවක් අනුකරණයයි.
2. නාට්‍ය යනු අවස්ථාවක් අනුකරණයයි.
3. නාට්‍යය යනු ජීවිතයේ පැතිකඩකි.
4. නාට්‍යය ජීවිතයේ පැතිකඩකි. සිරිත් විරිත් වල කැඩපතකි.
5. නාට්‍ය යනු ලෝකයේ සුඛ - දුක්ඛ යන දෙකෙන්ම යුක්තවූව අභිනයෙන් ඉදිරියෙන් කිරීමකි. (.........)

29. නිවැරදි පිළිතුර තෝරන්න.

දුර්ගා, ලක්ෂ්මී, සරස්වතී අතර අරගලයක් ඇති වීම සම්බන්ධ පුරාවෘත්තයක් ඇතුලත් වන හින්දු බැතිමතුන්ගේ උත්සවයක් වන්නේ,

1. නව රාත්‍රී මංගල්‍යය
2. මහා ශිව රාත්‍රි උත්සවය
3. තෛපොංගල් උත්සවය
4. දීපාවලී උත්සවය
5. මාඩුපොංගල් උත්සවය (.........)

30. කාන්තවරයාන් කුත්තු වලට ආවේණික ලක්ෂණයක් නොවන්නේ,

1. මාරි අම්මාන් දේවතාවිය හා ඇයගේ පුත්‍රයා පිළිබඳ අභිචාරාත්මක රංගනයකින් යුක්තය.
2. තුන් පැත්තකින් ආවරණය වූ උස් චතුරස්‍රාකාර වේදිකාවක් භාවිතා කරයි.
3. මෙහි ගමන් තාල වල ස්වභාවය නිසා 'තුල්ලු කුත්තු' යනුවෙන් ද ව්‍යවහාර වේ.
4. සොකරි නාටකයේ කථා පුවත සමඟ කතා සන්දර්භය සැසඳිය හැක.
5. එයටම ආවේණික වූ සුවිශේෂි ගීත රටාවන්ගෙන් සමන්විතය. (.........)

31. එම්. ශන්මුගලිංගම් ගේ නාට්‍ය නිර්මාණයක් නොවන්නේ,

1. උරවුහල්
2. අරුමෙයි නන්පර්
3. රාවනේෂන්
4. වේතාලම්
5. වේල්වීත්තී (.........)

- **පහත දැක්වෙන මාතෘකා ආශ්‍රයෙන් අංක 32 සිට 38 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| | | |
|---|---|---|
| A - ගුණසේන ගලප්පත්ති | B - දයානන්ද ගුණවර්ධන | C - ජයලත් මනෝරත්න |
| D - හෙන්රි ජයසේන | E - ධර්මසිරි බණ්ඩාරනායක | F - සුගතපාල ද සිල්වා |
| G - කේ.බී. හේරත් | H - සෝමලතා සුබසිංහ | I - එස්. විද්‍යානන්දන් |
| J - චන්ද්‍රසේන දසනායක | K - රංජිත් ධර්මකීර්ති | L - එදිරිවීර සරච්චන්ද්‍ර |
| M - එස්. මෞනගුරු | N - ආර්. ආර්. සමරකෝන් | O - සයිමන් නවගත්තේගම |

32. දෙවැනි මහින්ද හා ස්ත්‍රී නාට්‍ය රචනා කල රචකයින් දෙදෙනා වන්නේ,

1. B H 2. F C 3. E N 4. G O 5. C J (.........)

33. පිළිවෙළින් වාර්තා රංගය හා නාට්‍යධර්මී ශෛලීය අනුගමනය කල නාට්‍යකරුවන් දෙදෙනා වන්නේ,

1. C සහ N 2. F සහ L 3. D සහ G
4. A සහ B 5. B සහ L (.........)

34. ළමා නාට්‍ය නිර්මාණයෙහි ලා සුවිශේෂී නාට්‍යකරුවන් දෙදෙනා වන්නේ,

1. H සහ J 2. D සහ I 3. G සහ K
4. B සහ H 5. J සහ O (.........)

35. ගංගාවක් සපත්තු කබලක් හා මරණයක්, දෝන කතරිනා, හරිම බඩු හයක් යන නාට්‍ය තුන නිර්මාණය කළ නාට්‍යකරුවන් තිදෙනා පිළිවෙළින්,

1. A, C සහ E 2. O, G සහ F 3. O, B සහ L
4. D, G සහ K 5. B, G සහ L (.........)

36. දෙමළ නාට්‍ය කලාවට සුවිශේසී මෙහෙයක් කළ නාට්‍යකරුවන් දෙදෙනා වන්නේ,

1. J සහ I 2. I සහ M 3. M සහ J
4. J සහ E 5. D සහ F (.........)

37. වේදිකා නාට්‍ය මෙන්ම සිනමාවේද රංගනයෙන් දායක වූ නාට්‍යකරුවන් තිදෙනා වන්නේ,

1. A, B සහ D 2. C, E සහ H 3. F, G සහ L
4. B, G සහ H 5. F, H සහ J (.........)

38. පිළිවෙළින් ගුරු තරුව. හුණුවටයේ කතාව හා මෝදර මෝල යන නාට්‍ය නිර්මාණකවරුන් වන්නේ,

1. C, D සහ K 2. C, G සහ N 3. B, D සහ E
4. D, F සහ K 5. G, H සහ L (.........)

39. ලංකා විශ්ව විද්‍යාලයේ සිංහල ශාස්ත්‍රිය සමිතිය මගින් ඉදිරිපත් කළ නාට්‍ය වේ.

1. මායාදුන්නේ, රොඩිකෙල්ල, විධුර
2. කඩවුණු පොරොන්දුව, පෙරළෙන ඉරණම, සැඟවුණු පිළිතුර
3. දුටු ගැමුණු, මායාවතී, වැරදුණු දීගය
4. උත්තරරාම චරිතය, පණ්ඩුකාභය, ඔතෙලෝ
5. ලීලියොම්, හැම්ලම්, මේජර් බාබරා (.........)

40. ගාමිණි හත්තෙට්ටුවේගම මහතා ප්‍රධානත්වය දැරූ විදී නාට්‍ය කණ්ඩායම හැඳින්වුයේ,

1. විවෘත විදී නාට්‍ය කණ්ඩායම ලෙසය.
2. රටේ දැක්ම විදී නාට්‍ය කණ්ඩායම ලෙසය.
3. අපේ කට්ටිය විදී නාට්‍ය කණ්ඩායම ලෙසය.
4. විශ්ව විද්‍යාල කොලිජ්යේ විදී නාට්‍ය කණ්ඩායම ලෙසය.
5. ජනතාවාදී විදී නාට්‍ය කණ්ඩායම ලෙසය. (.........)

**නාට්‍ය හා රංගකලාව**

13 ශ්‍රේණිය - I පත්‍රය

**II කොටස**

**◈A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## A - කොටස

01. i. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය දෙකටම අයත් කලා අංග 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)

 ii. ඉන් එක් කලා අංගයක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

 iii. ශ්‍රව්‍ය දෘශ්‍ය කලා අංග අතර නාට්‍යයට හිමිවන සුවිශේෂිත්වය උදා සහිතව විස්තර කරන්න. (ලකුණු 06 යි)

02. i නාට්‍යයක ගැටුම යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

 ii. නාට්‍යයක ගැටුම් අවස්ථාවක් නිර්මාණය කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු ලියා දක්වන්න. (ලකුණු 05 යි)

 iii. ඉහත දැක්වූ කරුණු ඔබ නැරඹූ නාට්‍යයක් ඇසුරින් පහදන්න. (ලකුණු 06 යි)

03. i. රූපණය සම්බන්ධව පෙරදිග හා අපරදිග සංකල්පයන් ඉදිරිපත් කළ විද්වතුන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)

 ii. ඉන් එක් විද්වතකු ඉදිරිපත් කළ රූපණ සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

 iii. රූපණ කාර්යයේදී නළුවකු විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

## B- කොටස

04. i. පෙරදිග හා අපරදිග සංකල්පය තුළ නාට්‍යයක වස්තුව යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 04 යි)

 ii. අපරදිග සංකල්පයට අනුව නාට්‍යයක වස්තුවෙහි වැදගත් ම අංගය පිළිබඳව හැදින්වීමක් කරන්න. (ලකුණු 05 යි)

 iii. පෙරදිග සංකල්පයෙහි නාටයයක වස්තුවෙහි අවස්ථා ශාකුන්තලය නිදසුන් කොට ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

05. i. යථාර්ථවාදී නාටය රීතියේ මූලික ලක්ෂණ මොනවාද? (ලකුණු 04 යි)

 ii. මෙම නාට්‍ය රීතිය ඇති වීමට මුල් වූ සමාජ පසුබිම පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

 iii. යථාර්ථවාදී නාට්‍යකරුවකුගේ නාට්‍ය කෘතියක් මගින් සමාජ යථාර්තය පිළිඹිබු වන ආකාරය විමසන්න. (ලකුණු 06 යි)

06. i. ජුලියස් සීසර් නාට්‍යයට මුලාශ්‍ර වූ කථාව කුමක්ද? (ලකුණු 04 යි)

 ii. ජුලියස් සීසර් නාට්‍යයේ ඛේදනිය වීරයා නම් කර ඔහුගේ අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

 iii. ඔතෙලෝ නාට්‍යයේ ඩෙස්ඩිමෝනා, ඉයාගෝ, කැසියෝ, යන චරිත පිළිබඳ හැදින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

57 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය .............................                නාට්‍ය හා රංගකලාව II                කාලය පැය තුනයි

උපදෙස්

- ♦ I කොටස II කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- ♦ II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- **නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

01. නාට්‍යමය ලක්ෂණ සහිත බෞද්ධ පූජා කර්ම තුනක් අන්තර්ගත වරණය තෝරන්න.
    1. සුවිසි විවරණ. ගුරුගේ මාලාව, හේවිසි
    2. ආලවක දමනය, සුවිසි විවරණ, ගුරුගේ මාලාව
    3. මිලින්ද ප්‍රශ්නය, දොරකඩ අස්න. යුගාසන බණ
    4. දොරකඩ අස්න, යුගාසන බණ, පත්තිනි පද
    5. ආසන දෙකේ බණ, මිලින්ද ප්‍රශ්නය. කඩවස්තරණය (.........)

02. කොහොඹා කංකාරියේ ඇතුළත් නාට්‍යමය පෙළපාලි තුනක් අන්තර්ගත වරණය කුමක්ද?
    1. දර්පණ යක්කම. ගබඩා කොල්ලය, නයා යක්කම
    2. පිල්ලු වීදිය, ඊ ගස, හා අටමඟල වීදිය
    3. මල්බලි, පිල්ලු වීදිය හා දොකොන විලක්කුව
    4. සන්නි යකුම් විදීය, ඊගස හා අටමගල වීදිය
    5. අට මඟල වීදිය, සන්නියකුම් විදීය හා නවමාලේ මල් බලිය (.........)

03. සන්නියකුම් යාගයේ රංගභූමි අලංකරණ තුනකි.
    1. දෙකොන විලක්කුව, සූනියම් විදීය සහ ඊගස
    2. පිල්ලු විදීය, ඊ ගහ, හා අටමඟල වීදිය
    3. මල්බලි, පිල්ලු වීදිය, හා දෙකොන විලක්කුව
    4. සන්නි යකුම් වීදිය, මල් යහන හා කපාල කුඩුවය
    5. අට මඟල වීදිය, සන්නියකුම් වීදිය, නවමාලේ මල් බලිය (.........)

04. රිද්දියාගයේ හෙවත් රටයකුම් යාගයේ නාට්‍යමය අවස්ථා තුනක් අන්තර්ගත වරණය තෝරන්න.
1. දරු නැළවිල්ල, හැන්දෑ සමයම, උෂ්රා යක්කම
2. මරා ඉපැද්දීම, අඹ විදමන. කපුයක්කාරිය
3. නයා යක්කම, නානුමුරය, පන්දම් නැටීම
4. දොළහ පෙළපාලිය, දරු නැළවිල්ල, ලිච්ඡවී නැටුම
5. නානුමුරය, කපුයක්කාරිය, දරු නැළවිල්ල (.........)

05. ගම්මඩු ශාන්ති කර්මයට අදාල අංග වන්නේ,
1. ඇත් බන්ධනය, කුමාර පෙළපාලිය හා මල නැටීම
2. අඹ විදමන, යක් ඇනුම, හා මරා ඉපැද්දීම
3. දොළහ පෙළපාලිය, ඇත්බන්ධනය හා යක් ඇනුම
4. රාමා මැරීම, අඹ විදමන හා මරා ඉපැද්දීම
5. මී බන්ධනය, ඇත් බන්ධනය හා දුනුමාලප්පුව (.........)

06. අඹ විදමන නම් නර්තනාංගය හමුවන්නේ,
1. ගම්මඩුවේ ය.
2. කොහොඹා කංකාරියේ ය.
3. සන්නියකුමේ ය.
4. සූනියම් යාගයේ ය.
5. කිරිමඩුවේ ය. (.........)

07. විශේෂයෙන් රචනා කරන ලද නාටය පිටපතක් පදනම් කොට ගන්නා ජන නාටය සම්ප්‍රදාය වනුයේ,
1. කෝලම් ය. 2. කාමන්කූත්තුය. 3. නාඩගම් ය.
4. සොකරිය 5. දහඅට සන්නියය. (.........)

08. ආගමික සම්බන්ධයකින් තොර වූ නාට්‍ය ලක්ෂණ සහිත අංගය වනුයේ,
1. ආලවක දමනය 2. වඩිග පටුනය 3. දොරකඩ අස්නය
4. යුගාසන බණය 5. සුවිසි විවරණය (.........)

09. ඉසට ඉසලන්නට ජයලන්තු තොප්පියක් - කරට කරලන්ට මුතු බැඳපු මාලයක්
ඉනට ඉනලන්ට සුදු කරපු හවඩියක් - කපාලා දෙමුව ගම මහගේ බරට ගාතයක්' යන කවි ගායනය අන්තර්ගතව ඇත්තේ,
1. වඩිග පටුනේ ය. 2. රාමා මැරීමේය 3. උෂ්රා යක්කමේය
4. මරු සන්නියේ ය. 5. නයා යක්කමේය. (.........)

10. වැඩිපුරම නාට්‍යමය ලක්ෂණ දක්නට ඇත්තේ,
1. සබරගමු නර්තන සම්ප්‍රදායේ ය.
2. කථක් නර්තනයේ ය.
3. පහතරට නර්තන සම්ප්‍රදායේ ය.
4. උඩරට නර්තන සම්ප්‍රදායේ ය.
5. දෙමළ නර්තන සම්ප්‍රදායේ ය. (.........)

- **පහත දැක්වෙන මාතෘකා ආශ්‍රය කර ගනිමින් ප්‍රශ්ණ අංක 09 සිට 13 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| | | |
|---|---|---|
| A - මිරිස්ස | F - ප්‍රොසීනියම් වේදිකාව | K - මධ්‍යම පාන්තික සමාජය |
| B - රොලීනා | G - අවසන් භෝජන රාත්‍රිය | L - එල්ෆින්ස්ටන් ඩ්‍රැමටික් කම්පැනි |
| C - ගෙත්සමනි උයන | H - සිරිසේන විමලවීර | M - කපටි ආරක්ෂකයා |
| D - හරිශ්චන්ද්‍ර | I - අලගනායිඩු | N - වෙස් අත්ත |
| E - පේඩ් විදානේ | J - මරණයෙන් උත්ථානය | O - මංගලම් ගීතය |

09. පාස්කු හා සම්බන්ධ වන්නේ,
1. A B E   2. C G J   3. F G H
4. K L M   5. I N O   (.........)

10. කෝලම් හා සම්බන්ධ වන්නේ,
1. A E N   2. D F H   3. A D N
4. I J K   5. L M N   (.........)

11. නාඩගම් හා සම්බන්ධ වන්නේ,
1. A B C   2. C E F   3. D I O
4. H K L   5. M N O   (.........)

12. නූර්ති හා සම්බන්ධ වන්නේ,
1. F G H   2. B F L   3. A G H
4. L M N   5. E N O   (.........)

13. මීටර්, මිනර්වා හා සම්බන්ධ වන්නේ,
1. A C G   2. E M N   3. B D H
4. J K L   5. H K M   (.........)

16. නාට්‍යධර්මී ශෛලිය හා ලෝකධර්මී ශෛලිය යන ශෛලීන් දෙකම එක් කොටගත් නාට්‍ය විශේෂ අයත් ගොනුව වන්නේ,
1. මනමේ, සිංහබාහු, රත්තරං
2. රත්තරං, කාලගෝල, රාජකපුරු
3. එලොව ගිහින් මෙලොව ආවා, නරිබෑණා. රත්තරං
4. නරිබෑනා, සිංහබාහු, දික්තල කාලගෝල
5. මනමේ, නරිබෑණා, සිංහබාහු   (.........)

17. වාර්තා රංගය නැමැති රංග ක්‍රමයට අයත් වේදිකා නාට්‍ය ගොනුව වන්නේ,
1. ඉබිකට්ට, මාහේනේ කතාව, සොක්‍රටීස්
2. ගජමන් පුවත, මධුර ජවනිකා, ආනන්ද ජවනිකා
3. තලමල පිපිලා, ගජමන් පුවත, රෝමය ගිනි ගනී
4. මධුර ජවනිකා, සුභ සහ යස, ආනන්ද ජවනිකා
5. කදා වලලු, මධුර ජවනිකා, හස්ති කාන්ත මන්තරේ   (.........)

18. පිය පුතු ගැටුම හෙවත් පරම්පරා දෙකක සිතුම් පැතුම් අදහස් උදහස් අතර ඇති පරස්පර බව කලාත්මකව හා මනෝ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විග්‍රහ කළ නාට්‍යයකි.

1. ඊඩිපස්
2. පුත්‍ර සමාගම
3. අපට පුතේ මගක් නැතේ
4. සිංහබාහු
5. මනරංජන වැඩ වර්ජන (.........)

19. දේශීය නාට්‍ය කලාවේ වේදිකා තාක්ෂණනයේ නව අත්හදා බැලීමක් වශයෙන් කැරකෙන වේදිකාව භාවිතා කළ නාට්‍ය වන්නේ,

1. මරාසාද් 2. ඉබි කට්ට 3. බක්මහ අකුණු
4. ඇසල සඳ අවන්හල 5. ලියතඹරා (.........)

20. සංගීතය භාවිතා නොකරන ලද නාට්‍ය වන්නේ,
1. දික්තල කාලගෝල 2. කැළණි පාලම 3. අන්දරේලා
4. ගුරු තරුව 5. සඳ කිඳුරු (.........)

21. ලංකාවේ නිෂ්පාදනය වූ නාට්‍ය අතර ස්වතන්ත්‍ර නාට්‍යයක් වන්නේ,
1. දේවතා එළි 2. තුරඟ සන්නිය 3. දැවැද්දෝ
4. මකරා 5. පුත්‍ර සමාගම (.........)

22. යථාර්ථවාදී නාට්‍ය කලාවේ පුරෝගාමියා
1. ස්ටැනිස්ලාව්ස්කි 2. බර්නාඩ් ෂෝ 3. හෙන්රික් ඉබ්සන්
4. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් 5. ඇන්ටන් චෙකොෆ් (.........)

23. රොමැන්ටික් නාට්‍ය රීතිය අනුගමනය කළ නාට්‍යයකි.
1. හෙන්රි බෙක්ගේ ද වල්චර්ස්
2. ඇන්ටන් චෙකෝෆ්ගේ ද බෙයාර්
3. මැක්සිම් ගෝර්කිගේ අම්මා
4. යෙව්ගිනි ෂ්වාට්ස්ගේ ද ඩ්‍රැගන්
5. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ ද ත්‍රී පෙනි ඔපෙරා (.........)

24. විශ්ව විද්‍යාල කෙලිජියේ ඉංග්‍රිසි නාට්‍ය කලාව දියුණු කළ පිරිස අතර ප්‍රමුඛ වේ.
1. ඇෂ්ලි හල්පේ, රංජනී ඔබේසේකර, ක්ලෝඩඩ් ජයවර්ධන
2. ජෙරොම් ලක්‍ෂමන් ද සිල්වා, පණිභාරත, බර්නාඩ් ෂෝ
3. නියුමාන් ජුබාල්, චාල්ස් අබේසේකර, ජෙරොම් ලක්ෂ්මන් ද සිල්වා
4. රවින්ද්‍රනාත් තාගෝර්, අයිරාංගනී සේරසිංහ, ජයසේකර අපොන්සු
5. සතිස්චන්ද්‍ර එදිරිසිංහ, නිකොලෝයි ගොගොල්, රුක්මණී දේවි (.........)

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

25. ''සීසර් මට ආදරය කළ තරමටම මා ඔහු ගැන වැලපෙනවා. ඔහු වාසනාවන්ත වූ තරමටම මා ඔහු ගැන සතුටු වුනා''

1. මාර්ක් ඇන්ටනි 2. බෘටස් 3. කස්කා
4. කැසියස් 5. සිසරෝ (.........)

26. ශේක්ස්පියර් ගේ 'ඔතෙලෝ' නැමැති නාට්‍යය පිළිබඳ වැරදි ප්‍රකාශය වන්නේ,

1. ඩෙස්ටිමෝනා අහිංසක මෙන්ම පවිත්‍ර ප්‍රේමයේ සංකේතයකි.
2. ක්‍රමයෙන් ඇති වන්නා වූ සැකය වෛරය දක්වා දිවෙන නාට්‍යමය සංදර්භයක් ඇත.
3. අවතාර, අනාවැකි හා දෛවෝපගත සිදුවීම් වලින් බහුලය.
4. 'විලෝ ගීතය' වැනි ගී සංකල්පනා දක්නට ඇත.
5. ප්‍රේමය විශ්වාසය, උන්නතිකාමය, ද්‍රෝහි බව. ඊර්ෂියාව වැනි මනෝභාවයන් සාකච්ඡා කෙරේ. (.........)

27. රුකඩ ගෙදර නාට්‍යයට අයත් අංක ගණන වන්නේ,

1. 2 කි 2. 4 කි 3. 3 කි 4. 5 කි 5. 6 කි (.........)

28. අභිඥාන ශාකුන්තලයෙහි සවැනි අංකයේ දී දුෂ්‍යන්ත රජුගේ නැති වී තිබූ මතකය යළිත් ඔහුට ලැබේ. මේ සඳහා හේතු වූ මුඛ්‍ය චරිතය වන්නේ,

1. නගර පාලක 2. සානුමති 3. කඤ්චුකි
4. විදූෂක 5. ධීවර පුරුෂයා (.........)

29. ඇන්ටිගනි නාට්‍ය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

1. ඊඩිපස් වූ කලී ඇන්ටිගනි ගේ පියාය.
2. යුරිඩිස් බිසව වූ කලී ක්‍රෙයෝන්ගේ බිරිඳයි.
3. ඉස්මෙන් වූ කලී ඇන්ටිගනී ගේ සොයුරියකි.
4. නාට්‍යයේ ආරම්භය සිදුවන්නේ තීබය මුල් කරගෙන යයි.
5. ඊඩිපස් හා ක්‍රයෝන් දෙසොහොයුරන් ය. (.........)

- **ප්‍රශ්න අංක 30 - 34 දක්වා ප්‍රශ්න සඳහා පහත සඳහන් කොටස ඇසුරින් පිළිතුරු සපයන්න.**

A - සමාජයේ කුළුණු F - හෙන්රි තර්ඩි ඇන්ඩ් හිස් කෝට් K - ලිලියොම්
B - ප්‍රතාප්සිං G - එමිල් සෝලා L - බී.ඒ.ඩබ්. ජයමාන්න
C - ඇලෙක්සැන්ඩර් ඩූමා H - ඊ.එෆ්.සී. ලූඩෝවයික් M - ලා පැරිසියන්
D - තෙරෙස් රැක්වින් I - රොබර්ස් ඇන්ඩ් රොබර්ස් N - වෙයාර් වුමන් රූල්
E - ඩොල්ස් හවුස් J - සීදේවි

30. රොමැන්ටික් නාට්‍ය කලාව හා සම්බන්ධ වන්නේ,

1. C J F 2. A G N 3. C E M
4. I K L 5. F M O (.........)

31. යථාර්ථවාදී නාට්‍ය කලාව හා සම්බන්ධ වන්නේ,

1. A D E 2. A J E 3. B E O
4. A D F 5. J L M (.........)

32. ස්වභාවිකවාදී නාට්‍ය කාලව හා සම්බන්ධ වන්නේ,

1. C D O 2. E G H 3. G D N
4. F H N 5. J L N (.........)

33. විශ්ව විද්‍යාලයීය නාට්‍ය හා සම්බන්ධ වන්නේ,

1. A L J 2. D F L 3. H L O
4. L M N 5. H K M (.........)

34. ටීටර් හා මිනර්වා නාට්‍ය හා සම්බන්ධව වන්නේ,

1. B H J 2. A K N 3. C L M
4. H M O 5. B K M (.........)

35. ශ්‍රී ලංකාවේ නිර්මාණය වූ ඉංග්‍රීසි නාට්‍ය කලාව ජාත්‍යන්තර තලටය රැගෙන යමින් විවිධ පරියේෂණාත්මක නිර්මාණ කරණයෙහි නියැලුනු ශිල්පිණියකි.

1. අයිරංගනී සේරසිංහ 2. කෞශල්‍යා ප්‍රනාන්දු 3. රුවන්ති ඩි චිකේරා
4. ඉන්දු ධර්මසේන 5. සෝමලතා සුභසිංහ (.........)

36. 19 වන ශත වර්ෂයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් කළ පාසල් කීපයක් ද ඉංග්‍රීසි නාට්‍ය නිෂ්පාදනය කල බව වාර්තාවේ. එයින් එකක් වන්නේ,

1. මහනුවර ධර්මරාජ විද්‍යාලයයි. 2. ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයයි.
3. ගාල්ල මහින්ද විද්‍යාලයයි. 4. කුරුණෑගල මලියදේව විද්‍යාලයයි.
5. මාතලේ ක්‍රිස්තුදේව විද්‍යාලයයි. (.........)

37. එම විදුහල 1974 දී නිෂ්පාදනය කළ විලියම් ශෝක්ස්පියර්ගේ නාට්‍ය වන්නේ,

1. The Human Voice 2. Mid Summer Night dream
3. Othelo 4. Our lanka
5. Fifty fifty (.........)

38. ඔතෙලෝ නාට්‍යට මූලාශ්‍ර වූයේ,

1. භගවත් ගීතාව 2. ඔඩිසිය 3. හෙකොටම්තිය
4. වීර කාව්‍ය 5. පුරාණෝක්ති (.........)

39. ඔතෙලෝ නාට්‍යයේ සිදුවීමේ විකාශනය වන ස්ථාන වන්නේ,

1. රෝමය හා පොම්පේ රාජ්‍යයයි. 2. වැනිසීය හා සයිප්‍රසය
3. තුර්කීය හා තීබසය 4. ඇතැන්ස් හා ස්පාර්ටාවය
5. හේමකූටය හා එංගලන්තය (.........)

40. ග්‍රීක ගායන වෘන්දයේ කාර්යභාරයක් නොවන්නේ,

1. චරිතයක් ලෙස ක්‍රියා කිරීම. 2. ගයමින් රඟමින් ප්‍රේක්ෂාව ජනිත කිරීම.
3. අංක අතර සබන්ධතාවය රැකීම. 4. පූර්ව රංගයට වේදිකාවට ආරාධනා කිරීම.
5. වේදිකාවේ හිස් බව නැති කිරීම. (.........)

# නාට්‍ය හා රංගකලාව

## 13 ශ්‍රේණිය - II පත්‍රය

## IIකොටස

◆A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### A - දේශීය නාට්‍ය කලාව

01. i. පහතරට හා සබරගමු ශාන්ති කර්ම දෙක බැගින් නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. ඔබ නම් කරන ලද ඕනෑම ශාන්ති කර්මයක අන්තර්ගත නාට්‍යමය පෙළපාළි නම් කර එකක් හඳුන්වා දෙන්න. (ලකුණු 05 යි)
    iii. 'ශාන්තිකර්ම තුළින් ගැමි නාටක ආභාෂය ලබා ඇත'. මෙම කියමන නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

02. i. මනමේ නාට්‍යයෙන් පසු සරච්චන්ද්‍රයන් ගේ නිර්මාණශිලිත්වය කැපී පෙනුනු නාට්‍ය නිර්මාණ 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. ඉන් එක් නාට්‍යයක රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
    iii. 60 දශකය දේශීය නාට්‍ය කලාවේ පෝෂණයට දායක වූ නාට්‍යකරුවන් දෙදෙනෙකුගේ සේවය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

03. i. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික දෙමළ නාට්‍ය කලාව ප්‍රචලිත ප්‍රදේශ නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. ඉන් එක් ප්‍රදේශයක ප්‍රචලිත දෙමළ නාට්‍ය මාදිලි නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)
    iii. ශ්‍රී ලංකාවේ දෙමළ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ දෙමළ නාට්‍යකරුවන් තිදෙනෙකු නම් කර ඉන් එක් අයෙකුගෙන් සිදු වූ සේවය අගයන්න. (ලකුණු 06 යි)

### B - කොටස

04. i. හස්තිකාන්ත මන්තරය නාට්‍යයේ කතානායකයින් නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. එම නාට්‍යයේ රංග ශෛලිය පිළිබඳව හඳුන්වන්න. (ලකුණු 05 යි)
    iii. හස්තිකාන්ත මන්තරය නාට්‍යයෙන් පිළිඹිබු වන ජීවන දෘෂ්ඨිය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

05 i. සාර්ථක නාට්‍ය පිටපතක තිබිය යුතු ලක්ෂණ මොනවාද? (ලකුණු 04 යි)
    ii. නාට්‍යය පෙළක් රංගයක් බවට පත්කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙල පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
    iii. 'නාට්‍ය යනු සාමුහික ක්‍රියාවලියක ප්‍රතිඵලයකි' මෙම කියමන නිදසුන් දක්වමින් සනාථ කරන්න. (ලකුණු 06 යි)

06. i. මුදු පුත්තු නාට්‍යයට පාදක වූ මුල් කෘතිය සහ එහි රචකයා නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. මුදු පුත්තු නාට්‍යයේ නිර්මාණකරුවා නම් කර එහි ඔබ කැමැති චරිත දෙකක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි)
    iii. තම නිෂ්පාදනය සාර්ථක කර ගැනීම සඳහා නිර්මාණකරුවා විසින් මුල් කෘතිය හා අනුවර්තනයේ දී සිදුකළ වෙනස්කම් මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

# නාට්‍ය හා රංගකලාව 2018 - දෙවන වාර පරීක්ෂණය

## 13 ශ්‍රේණිය - I පත්‍රය

**1 කොටස - පිළිතුරු**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 4 | 11. | 3 | 21. | 3 | 31. | 3 |
| 2. | 1 | 12. | 2 | 22. | 4 | 32. | 4 |
| 3. | 3 | 13. | 3 | 23. | 5 | 33. | 5 |
| 4. | 4 | 14. | 4 | 24. | 2 | 34. | 1 |
| 5. | 3 | 15. | 2 | 25. | 1 | 35. | 2 |
| 6. | 3 | 16. | 2 | 26. | 4 | 36. | 2 |
| 7. | 2 | 17. | 3 | 27. | 3 | 37. | 2 |
| 8. | 2 | 18. | 5 | 28. | 3 | 38. | 1 |
| 9. | 4 | 19. | 5 | 29. | 1 | 39. | 3 |
| 10. | 1 | 20. | 1 | 30. | 4 | 40. | 1 |

**1 පත්‍රය - 11 කොටස.**

**A– කොටස**

01. i. වේදිකා නාට්‍යය, සිනමාව, රූපවාහිනිය, රූකඩ, නාර්තනය, බැලේ, ඔපෙරා, සංගීතය, ආදී කලා අංග 04 ක් නම් කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ල. 04)

ii. ඉන් එක් කලා අංගයක් විස්තර කර ඇත්නම් ලකුණු 05 ක් ලබා දෙන්න.

iii. සජීවී බව, නාට්‍ය පෙළක් තිබීම, ආනුෂාංගික කලා වල මනා සුසංයෝයක් තිබීම, ඍජු ප්‍රේක්ෂක සහභාගීත්වය, සතර අභිනයම භාවිතා කිරීම, ශෛලියක් තිබීම, සාමුහික කලා අංගයක් වීම, ගබඩා කර තබා ගත නොහැකිවීම.

ආදී වූ කරුණු උදාහරණ දක්වමින් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

02. i. ප්‍රතිවිරුද්ධ බලවේග දෙකක් අතර හැප්පීම නැතහොත් සට්ටනය ගැටුම නම් වේ. ඕනෑම නාට්‍යයක කිසියම් සමාන නොවන බලවේග දෙකක් එකට හැප්පීම දක්නට ලැබේ. මෙය දෘශ්‍යමාන හෝ අදෘශ්‍යමාන විය හැකිය.

ii. බලවේග දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තිබිය යුතුය.
නාට්‍යෝචිත බවකින් යුක්තවීය යුතුය.
කුතුහලය ජනිත විය යුතුය.
ප්‍රේක්ෂක අවධානය රඳවා තබාගැනීමේ හැකියාව තිබිය යුතුය.

ආදී වශයෙන් ප්‍රශ්නයට අදාලව කරුණු ගොනුකර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

iii. නරඹා ඇති නාට්‍යයක් ඇසුරින් ප්‍රශ්නයට අදාලව කරුණු දක්වා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

03. i. පෙරදිග:- භරතමුණි   අපරදිග :- ස්ටැනිස්ලාව්ස්කි, බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්

ii. ඉන් එක් විද්වතෙකු ඉදිරිපත් කර ඇති සංකල්පය පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න. ( 12 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශයේ 26,27 පිටු භාවිතා කරන්න.)

iii. 01. නාට්‍ය පිටපත අධ්‍යයනය කිරීම.
02. චරිත ස්වභාවය අවබෝධ කොට ගැනීම.
03. අධ්‍යක්ෂකවරයාගේ අර්ථකතනය පැහැදිලි කරගැනීම.
04. අඛණ්ඩ පුහුණුවීම්වල යෙදීම.
05. සතතාභ්‍යාසවල යෙදීම.
06. නළු කාර්යය හොඳින් ඉටු කිරීම.
ආදිය උදාහරණ දක්වමින් කරුණු පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.

## B - කොටස

04. i. පෙරදිග:- භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව 'වස්තුව' යනු නාට්‍යයක ශරීරය ලෙස දක්වා ඇත. එනම් අත්දැකීම් හෝ සිද්ධි මාලාවක් නාට්‍යයකට උචිත පරිදි ගොතා ඇති ආකාරයයි. සංස්කෘතික නාට්‍ය කලාවේ ඉතිවෘත්තය නමින්ද මෙය හැඳින්වේ.

අපරදිග සංකල්පය:- ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රයට අනුව 'වස්තුව' යනු කතා වින්‍යාසයයි. එනම් මුල මැද අග සිදුවීම් ගැලපීමේ පිළිවෙලයි.

ii. කතා වින්‍යාසය (polt) වැදගත්ම අංගයයි.
එය කරුණු තුනකින් සමන්විත විය යුතුය.
01. පරිසමාප්තියකින් යුක්ත වීම. 02. පරිපූර්ණාත්වයකින් යුක්ත වීම.
03. සැලකිය යුතු දිග ප්‍රමාණයකින් යුක්ත වීම.
සරල හා සංකීර්ණ වශයෙන් 02 කි. සරල කතා වින්‍යාසය තුළ ආකුලිකරණය අනාවරණයත් සංකීර්ණ කතා වින්‍යාසය තුළ ඒ දෙක ද ඇතුලුව ප්‍රත්‍යාවර්තනය හා ප්‍රත්‍යාභිඥානයත් දක්නට ලැබීම.
ත්‍රිවිධ ඒකත්වය
කැකාර්සීන්කරණය
ආදී කරුනු සඳහන් කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

05. i චරිතය හා සිදුවීම් වල විකාශනය සහේතුකය.
චරිත පැතැලි බවින් තොරය.
කතාවේ තාලය හා අවකාශය තර්කානුකූලව ගලපා තත්වානුරූපීමයාවට යටත් කර ඉදිරිපත් කිරීම.
ආත්ම කථන, අහකට කථා, විස්තර කථනය වැනි උපක්‍රම භාවිතා නොකිරීම.
සාමාන්‍ය භාෂා භාවිතයක් දැකිය හැකි වුවත් කාව්‍යමය ලක්ෂණ දැකිය හැකි වීම.
කාලීන මිනිස් ජීවිතයේ සැබෑ තතු, ප්‍රශ්න හා ගැටළු වඩාත් තාත්වික ලෙසින් වේදිකාව මත නිරූපණය කිරීම. (ල. 04)

ii. යුරෝපයේ සිදු වූ සමාජ ආර්ථික දේශපාලනමය සංසිද්ධීන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් යථාර්ථවාදී නාට්‍යරීතිය බිහිවිය. විශේෂයෙන්ම විද්‍යාත්මක චින්තනය, කාර්මික විප්ලවය. නව බුද්ධිමය ප්‍රබෝදය යන කරුණු ද ඒ සඳහා ඉවහල් විය. (ල. 05)

iii. අපේක්ෂකයා සපයා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

06. i බලකාමය මෙහි ප්‍රධාන තේමාවයි. එනම් රාජ්‍ය බලය අරඹයා පැන නඟින ගැටුමක් පදනම් කරගත් තේමාවකි. සීසර් සහ බෲටස් රාජ්‍ය පාලන විධික්‍රම පිළිබඳ ප්‍රතිවිරුද්ධ අදහස් දැරීය ඔවුන් දෙදෙනා අතර බලය හා දේශවාත් ශල්‍ය හේතුකොට ඇතිවන අරගලය හේතුවෙන් දෙදෙනාම ඛේදයට පත්වීම එක් තේමාවක් ලෙස දැක්විය හැකිය. (මීට අවතරව වෙනත් පිළිගත හැකි වෙනත් තේමාවක් ලියා ඇත්නම් සලකා බලා ලකුණු ලබාදෙන්න.) (ල.04)

ii. බෲටස් නම් කර ඊට අදාළ ලෙස අරමුණු පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iii. චරිත පිළිබඳ වෙන් වශයෙන් හඳුන්වා දී ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.06)

# නාට්‍ය හා රංගකලාව

## 13 ශ්‍රේණිය - II පත්‍රය

**I කොටස - පිළිතුරු**

| | | | |
|---|---|---|---|
| 1. 3 | 11. 2 | 21. 1 | 31. 2 |
| 2. 1 | 12. 1 | 22. 3 | 32. 3 |
| 3. 4 | 13. 3 | 23. 4 | 33. 3 |
| 4. 5 | 14. 2 | 24. 1 | 34. 5 |
| 5. 4 | 15. 5 | 25. 2 | 35. 3 |
| 6. 1 | 16. 3 | 26. 3 | 36. 2 |
| 7. 3 | 17. 2 | 27. 3 | 37. 2 |
| 8. 2 | 18. 4 | 28. 5 | 38. 3 |
| 9. 3 | 19. 3 | 29. 5 | 39. 2 |
| 10. 3 | 20. 2 | 30. 1 | 40. 4 |

**II කොටස - පිළිතුරු**

**A - දේශීය නාට්‍ය කලාව.**

01. i. පහතරට ශාන්තිකර්ම :- දොවොල් මඩු / ගම්මඩු, සන්නියකුම, සූනියම්යාගය
සබරගමු ශාන්තිකර්ම:- පහන්මඩු, කිරිමඩු

ii. මින් එක් ශාන්තිකර්මයක නාට්‍යමය පෙළපාලි නම්කර ඉන් එක් පෙළපාලියක නාට්‍යමය ලක්ෂණ පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න. (ල. 05)

iii. උඩරට කොහොඹා කංකාරියේ නයා යක්කමේ වී වැනීමේ අවස්ථා හා කවි සොකරි නාටකයේ වී වැනීමේ අවස්ථාවට සමානවීම.
ගම්මඩු දොවොල් මඩු ශාන්තිකර්මයන්හි අන්තර්ගත මරා ඉපැද්දවීම නම් නාට්‍යමය අවස්ථාවේදී භාවිතා කරන කවි ආදිය සොකරි නාටකයේ පරයාට නැගිටින ලෙස කියන අවස්ථාවේදී භාවිතා කරන කවි හා සමානවීම.
සන්නියකුම ශාන්තිකර්මයේ මහාකෝලසන්නි යක්ෂයාගේ පැමිණීමේ කඩවත්තුරණය හා සමානකමක් සොකරි නාටකයේ ලංකාවට ගොඩබැසීමේදී කඩවතක් දක්නට ලැබීමේ අවස්ථාව හා සමාන වීම.
සන්නියකුම් යාගයේ ආභාෂය කෝලම් වල දක්නට ලැබීම.
ඉදිරිපත් කිරීම්වල, කවි ගායනාවල යොදාගන්නා භාණ්ඩවල සහ ඇතැම් වෙස්මුහුණුවල සමානතා දක්නට ලැබීම.
ප්‍රශ්නයට අදාලව කරුණු ගොනුකර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

02. i. සිංහබාහු, වෙස්සන්තර, කදාවළලු, මහාසාර, ලෝමහංස, හවකඩතුරාව, හස්තිකාන්ත මන්තරේ, ජේමතෝජායතී සොකෝ ආදී නාට්‍ය හතරක් ලියා ඇත්නම් ලකුණු 04 ක් ලබාදෙන්න.

ii. ඉන් එක් නාට්‍යයක රංග ශෛලිය පැහැදිලි කර ඇත්නම් ලකුණු 05 ක් ලබාදෙන්න.

iii. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා  දයානන්ද ගුණවර්ධන මහතා  සුගතපාල ද සිල්වා මහතා
ගුණසේන ගලප්පත්ති මහතා  හෙන්රි ජයසේන මහතා
මෙම නාට්‍යකරුවන්ගෙන් දෙදෙනෙකුගේ නාට්‍ය පිටපත් අධ්‍යක්ෂණ රංගන ආදීය ඇතුළු ඔවුන්ගෙන් නාට්‍ය කලාවට වූ සේවාව ඇගයීමට ලක්කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල.06)

03. i. මඩකලපුව, (වව්නියාව, මුලතිව්) වන්නිකලාපය, යාපනය. හලාවත, මන්නාරම

ii. මඩකලපුව :- වඩමෝඩි, තෙන්මෝඩි, මකිඩි, විලාසම්, චේතාර්‍යාරී
වන්නිකලාපය :- කෝවලන්, කන්නහිකුත්තු
යාපනය :- වඩමෝඩි, තෙන්මෝඩි, රෝමානු කතෝලික කුත්තු, කාන්තවරයාන් කුත්තු
මන්නාරම:- යාල්පාන පාක්කු, තෙන්පාක්කු, රෝමානුකතෝලික කුත්තු, වාසකප්ප
හලාවත:- මාර්කන්තන්, වාලව්මන්කුත්තු

iii. කේ. කනපතිපිල්ලේ, චෞර්ණලිංගම්, එස් විද්‍යානන්දන්, එස්. මෞනගුරු, එම් ශර්මුගලිංගම්, මොවුන්ගෙන් තිදෙනෙකුගේ සේවය පිළිබඳව ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.

04. i. උදයන රජු හා චන්ඩප්ප්පෝත රජු (එක් අයෙක් පමණක් ලියා ඇත්නම් ලකුණු 02) (ල. 04)

ii. සංවාද ගද්‍ය හා පද්‍ය ස්වරූපයෙන් යොදාගෙන තිබීම.
පාත්‍රයන් ආංගික හා සාත්වික අභිනය ඉදිරිපත් කිරීම පිනිස විවිධ මුද්‍රා ක්‍රම භාවිතා කර තිබීම.
නර්තනය හා මුද්‍රා නාට්‍ය ලක්‍ෂණ යොදාගැනීම.
විවිධ භාෂණ ක්‍රම භාවිතා කිරීම.
(ආදී වශයෙන් කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.) (ල. 05)

iii. ප්‍රශ්නය තේරුම්ගෙන අපේක්‍ෂකයා සපයා ඇති පිළිතුර සලකා බලා ලකුණු දෙන්න. (ල.06)

05. i. ප්‍රබල තේමාවක් ඇතුලත් වීම.
මුල මැද අග මනාව ගලපා තිබිය යුතුය.
ප්‍රේක්‍ෂකයාගේ ජීවිත අවබෝධය පුළුල් කරන අත්දැකීම් අන්තර්ගතවීම.
නාට්‍යෝචිත අවස්ථා ඇතුළත් වීම.
ප්‍රබල ගැටුම් අවස්ථා අන්තර්ගත වීම.
රංගමය වටිනාකමක් තිබීම.
චරිත ප්‍රබල වීම හා අන්‍යචරිත අතර ඇති සම්බන්ධය මනාව ගැලපීම.
රමණීය භාෂා ප්‍රයෝග අනුගමන කර තිබීම.

ii. පිටපත අවබෝධ කර ගැනීම.
නිෂ්පාදන පිටපත සකස් කර ගැනීම.
නළුවරණ සිදු කිරීම.
ආනුෂාංගික ශිල්පීන් තෝරාගැනීම.
නාට්‍ය පෙළ හඳුන්වා දෙමින් පුහුණුවීම් ආරම්භ කිරීම.
ආනුෂාංගික අංග සම්බන්ධ කිරීම.
රංගාලෝක පුහුණුව
සවේශ පුහුණුව
මංගල දර්ශනය පැවැත්වීම.

iii. අපේක්‍ෂකයා සපයා ඇති පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න.

06. i. යෙර්මා, ෆෙඩ්රික් ගාර්සියා ලෝකා

ii. ගුණසේන ගලප්පත්ති, සරා, තේගිරිස්, දියෝනිස්, ආදී ප්‍රධාන චරිත ඇතුළු සෙසු චරිත දෙකක් නම් කර ඔවුන් පිළිබඳව කෙටියෙන් හඳුන්වා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.

iii. යෙර්මා ගොවිබිම් හිමි යුවන් සමග විවාහ වී නිදහසේ ජීවත් වූ දරුවන් අහිමි කාන්තාවකි.
යුවන් යෙර්මාට දරුවකු නොදෙන්නේ හිතාමතාය එබැවින් ඇය මානසිකව වියරුවකට පත් වේ.
සරා වඳ යැයි සමාජ සමච්චලයට ලක්වන අතර තේගිරිස් ඇගේ සිතුම් පැතුම් නොසලකා හරියි.
යෙර්මා නාට්‍යයෙහි යුවන් දරුවකුට ආසා නොකරයි.
මුදුපුත්තු නාට්‍යයෙහි තේගිරිස් දරුවෙකුට කැමැත්තෙන් සිටියි.
යුවාන් යෙර්මාගේ ගෙල මිරිකා මරයි.
තේගිරිස් දරුවාගේ ගෙල මිරිකා මරයි.
ආදී වූ වෙනස්කම් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.